පුවත්පත් නිවේදනයයි.

# සිරස එම්.ටී.වී මාධ්‍ය ආයතනයට එල්ල වූ සන්නද්ධ මැර ප්‍රහාරය සම්බන්ධයෙන් කාන්තාවන්ගේ විරෝධය

සිරස මාධ්‍ය ආයතනයට පසුගිය දිනෙක එල්ල වූ සන්නද්ධ මැර ප්‍රහාරය පිළිබඳව මෙරට ස්වාධීන කාන්තා සංවිධානවල බලවත් විරෝධය මෙලෙස ප්‍රකාශ කරමු. මෙය හුදෙක් මාධ්‍ය ආයතනයකට එරෙහිව කරනලද පෞද්ගලික පහරදීමක් ලෙස අපි කල්පනා නොකරන අතර එය මෙරට මාධ්‍ය නිදහසට, ජනතාවට ඇති තොරතුරු දැනගැනීමේ අයිතියට මෙන්ම ප්‍රජාතන්ත්‍රවාදයට එල්ල කරනලද මරු පහරක් සේ සලකමු. මාධ්‍ය විවිධත්වයට, විවිධ මත දැරීමේ - ඉවසීමේ සහ ගරුකිරීමේ සංස්කෘතියට එරෙහිව දියත්වන සංවිධානාත්මක ක්‍රියාදාමයක එක් අවස්ථාවක් ලෙස මෙය හඳුන්වාදිය හැක.

මාධ්‍යවේදීන් ඝාතනය කිරීම, පහරදීම, මාධ්‍ය නිදහස තර්ජනයට ලක් කිරීම සහ මාධ්‍ය ආයතන විනාශ කිරීමට උත්සාහ දැරීම මගින් සිදු කරන්නේ නිදහස් අදහස් ප්‍රකාශකිරීමට, තොරතුරු දැනගැනීමට ජනතාවට ඇති ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය විනාශ කිරීමයි. යාපනයේ උදයන් පුවත් පතේ මාධ්‍යවේදීන් මරා දැමීම පුවත්පත් කාර්යාලයට බෝම්බ ගැසීම සහ සිරස මාධ්‍ය ආයතනයට පහරදීම අතර වෙනසක් අපි නොදකිමු. උතුරු නැගෙනහිර නිදහස් කරගෙන රටට උදා කළායැයි කියනු ලබන සාමය දකුණේ ජනතාවට නොලැබී ඇත්තේ ඇයි? දකුණේ ජනතාවට, මාධ්‍යවේදීන්ට භීතියෙන් ජීවත්වීමට සිදුවී ඇත්තේ ඇයි ? අප එක්ව වහාම විසඳුම් සෙවිය යුතු ප්‍රශ්න කිහිපයකි.

මෙම මැරවරයින් නීතියේ රැහැනට අල්ලා ගැනීමට ආණ්ඩුව වහාම පියවරගත යුතු අතර ජනමාධ්‍යවේදීන්ගේ මෙන්ම එම ආයතනවල ආරක්ෂාවද තහවුරු කළ යුතුව තිබේ.

සැබෑ සාමය, ප්‍රජාතන්ත්‍රවාදය ගරු කරන මේ රටේ ස්ත්‍රීන්වන අප මෙම ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියාව දැඩි ලෙස හෙලා දකින අතර සිරස ආයතනයට අපගේ බලවත් කණගාටුවද ප්‍රකාශ කර සිටිමු.

1. කාන්තාව හා මාධ්‍ය සාමූහිකය - කොළඹ
2. ස්ත්‍රී සම්පත් මධ්‍යස්ථානය - කුරුණෑගල
3. කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම - කොළඹ
4. විකල්පනී ජාතික කාන්තා සංවිධානය - කොළඹ
5. ඩාබිඳු සාමූහිකය - කටුනායක
6. ප්‍රජා දිරිය පදනම -පුත්තලම
7. කාන්තා සංවර්ධන කේන්ද්‍රය - බදුල්ල
8. කාන්තා එකමුතුව - පොලොන්නරුව
9. ස්ත්‍රී මධ්‍යස්ථානය - ඒකල
10. සංක්‍රමණික කාන්තා සංවිධානය - රඹුක්කන
11. කාන්තා අධ්‍යාපන හා පර්යේෂණ කේන්ද්‍රය - කොළඹ
12. කාන්තා පර්යේෂණ කේන්ද්‍රය - කොළඹ